# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන)

**1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත** සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි

---

තාක්ෂණ අමාත්‍යතුමා විසින්
2024 මැයි මස 10 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 මැයි මස 02 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[257 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 84.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය:* මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ සංශෝධනය 13 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*3 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) වෙළඳපොළ විශ්ලේෂණය කිරීමට, සුවිශේෂී වෙළඳපොළ බලය වැළැක්වීමට සහ සාධාරණ තරගකාරීත්වය ප්‍රවර්ධනය කිරීමට කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ව්‍යාප්ත කිරීම; සහ

(ආ) 13 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික සංශෝධන සිදු කිරීම,

වේ.

*4 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 6අ වන නව වගන්තිය ඇතුළත් කිරීම මගින් ඒ ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, කොමිෂන් සභාවට ගාස්තු ක්‍රම අනුමත කිරීමට හෝ නිශ්චය කිරීමට බලය ලබා දීම වේ.

*5 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, 13 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

6 වන වගන්තිය: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, 13 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*7 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, 13 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*8 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 9අ වන නව වගන්තිය ඇතුළත් කිරීම මගින් ඒ ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, ප්‍රති-තරගකාරී පරිචයන් යනාදිය මගින් ඇති වන ආරාවුල් නිරවුල් කිරීමට කොමිෂන් සභාවට බලය ලබා දීම වේ.

*9 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම (1අ) වන සහ (1ආ) වන නව උපවගන්ති ඇතුළත් කිරීම මගින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අවසර පත්‍ර නිකුත් කිරීම මගින් ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය වෙන් කිරීමට සහ වෙන්කර දීමට කොමිෂන් සභාවට බලය පැවරීම වේ.

*10 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 10අ වන නව වගන්තිය ඇතුළත් කිරීම මගින් ඒ ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, අංක භාවිතය වෙන්කර දීමේ පරම අධිකාරය කොමිෂන් සභාව බවට පත් කිරීම සහ තත්කාර්ය සඳහා කොමිෂන් සභාවට ඇතැම් බලතල පවරා දීම වේ.

*11 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) 13 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික සංශෝධන සිදු කිරීම; සහ

(ආ) කොමිෂන් සභාව විසින් එම වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන නියමයන්ට අනුකූලව ක්‍රියා කරනු නොලබන තැනැත්තන්ට දණ්ඩන නියම කිරීම සහ එවැනි යම් දණ්ඩන ගෙවීම පැහැර හරිනු ලැබූ විට, ඒ දණ්ඩන මුදල අය කර ගන්නා ආකාරය නිශ්චිතව දැක්වීම සඳහා කොමිෂන් සභාවට බලය ලබා දීම සඳහා ඒ වගන්තියට (6) වන, (7) වන, (8) වන, (9) වන, (10) වන සහ (11) වන උපවගන්ති ඇතුළත් කිරීම,

වේ.

*12 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) 13 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික සංශෝධන සිදු කිරීම; සහ

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූවා වූ ක්‍රියාකරුවන්ට විධාන නිකුත් කිරීමට කොමිෂන් සභාවට බලය පැවරීම,

වේ.

*13 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියට ඉක්බිතිව ම 17අ වන සහ 17ආ වන නව වගන්ති ඇතුළත් කිරීම මගින් ඒ ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ-

(අ) 17 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා අමාත්‍යවරයාට බලය පැවරීමට; සහ

(ආ) කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා නොගෙන ඇතැම් යටිතල පහසුකම් සේවා සැපයීමේ නිරත වීම, විදුලි සංදේශ සේවා සැපයීමේ නිරත වීම සහ කේබල් ගොඩබිමට සම්බන්ධ කරන ස්ථාන පහසුකම් සැපයීමේ නිරත වීම ඕනෑම තැනැත්තකුට තහනම් කිරීමට, විධිවිධාන සැලැස්වීම,

වේ.

*14 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මඟ වශයෙන් වෙනස් කිරීමට කොමිෂන් සභාවට බලය ලබා දීම වේ.

*15 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ,-

(අ) 13 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික සංශෝධන සිදු කිරීම; සහ

(ආ) 18අ වන වගන්තියේ විධිවිධාන කඩ කරන ක්‍රියාකරුවකු මත පනවනු ලැබිය යුතු දඩ මුදලේ ප්‍රමාණය රුපියල් දස දහසේ සිට රුපියල් ලක්ෂයක් දක්වා වැඩි කිරීම,

වේ.

*16 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම 20අ වන නව වගන්තිය ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ-

(අ) ක්‍රියාකරුවන්ට අන්තර් සම්බන්ධන එකඟවීම්වලට එළඹීම සඳහා කටයුතු සැලැස්වීමට කොමිෂන් සභාවට බලය ලබා දීමට;

(ආ) අන්තර් සම්බන්ධන එකඟවීමක පාර්ශ්වකරුවන් වන ක්‍රියාකරුවන්ගේ ප්‍රති-තරඟකාරී පරිචයන් පිළිබඳ විමර්ශන පැවැත්වීම සඳහා කොමිෂන් සභාවට බලය පැවරීමට; සහ

(ඇ) අන්තර් සම්බන්ධන එකඟවීම් පිළිබඳ ගාස්තු අනුප්‍රමාණ සම්බන්ධයෙන් සහ අන්තර් සම්බන්ධන එකඟවීම් ක්‍රියාවට නැංවීම සඳහා, රීති සෑදීමට කොමිෂන් සභාවට බලය පැවරීමට,

විධිවිධාන සැලැස්වීම වේ.

*17 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) විදුලි සංදේශ උපකරණ අපනයනය සම්බන්ධයෙන් 21 වන වගන්තියේ විධිවිධාන අදාළ වීම ව්‍යාප්ත කිරීම; සහ

(ආ) ඒ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීම සඳහා වන දණ්ඩනය වැඩි කිරීමට ඒ වගන්තියේ (5) වන උපවගන්තිය සංශෝධනය කිරීම,

වේ.

*18 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) ගුවන්විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණවල සන්තකය ලබා ගැනීම සඳහා වන බලපත්‍ර නිකුත් කිරීමට;

(ආ) ඒ වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර ඉවත් කර ගැනීම හෝ වෙනස් කර ගැනීමට; සහ

(ඇ) මහජන යහපත පිණිස සහ ගුවන්විදුලි සංඛ්‍යාත පොදුවේ භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීම පිණිස ඒ වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමෙන් යම් තැනැත්තකු හෝ තැනැත්තන් පන්තියක් නිදහස් කිරීම සඳහා රීති සෑදීමට,

කොමිෂන් සභාවේ බලතල ව්‍යාප්ත කිරීම වේ.

*19 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) ශ්‍රී ලංකාවේ භූමිය, මහාමාර්ග හෝ දේශීය ජල තීරය මතින් හෝ ඊට යටින් කේබල් ඇදීමේ වැඩ කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට කොමිෂන් සභාවේ බලතල ව්‍යාප්ත කිරීම; සහ

(ආ) 22අ වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා කොමිෂන් සභාවට පදනම් කර ගත හැකි ඇතැම් නව හේතු හඳුන්වා දීම,

වේ.

*20 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වන වගන්තියට ඉක්බිතිව ම 22අඅ වන, 22අආ වන, 22අඇ වන සහ 22අඈ වන නව වගන්ති ඇතුළත් කරනු ලැබීම මගින් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනයේ නීතියේ බලපෑම වනුයේ-

(අ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා පොලීසියේ සහාය ඇතිව මේ පනත යටතේ විදුලි සංදේශ සේවා සැපයීම හා සම්බන්ධිත ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය ඇතුළත අතුරා ඇති සමුද්‍රාන්ත කේබල නියාමනය කිරීම, කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාව වෙත බලතල පැවරීම;

(ආ) සමුද්‍රාන්ත කේබල ආදිය අධීක්ෂණය කිරීමේ දී, කළමනාකරණය කිරීමේ දී සහ ආරක්ෂා කිරීමේ දී කොමිෂන් සභාව වෙත උපදෙස් ලබා දීම පිණිස ජාතික සමුද්‍රාන්තර කේබල් ආරක්ෂණ කමිටුව පිහිටුවීම;

(ඇ) සමුද්‍රාන්තර කේබලයක් සහ සමුද්‍රාන්තර කේබල් ගොඩබිමට සම්බන්ධ කරන ස්ථාන සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන ප්‍රකාශනයක් මගින් ආරක්ෂණ කලාප ප්‍රකාශයට පත් කිරීමට ජනාධිපතිවරයාට හැකියාව ලබා දීම;

(ඈ) යම් ආරක්ෂිත කලාපයකට ඉහළින් හෝ යටින් සිදු කිරීම තහනම් ක්‍රියාකාරකම් නිශ්චිතව දැක්වීම සඳහා රීති සෑදීමට කොමිෂන් සභාව වෙත බලතල පැවරීම; සහ

(ඉ) ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය හෝ ආරක්ෂිත කලාපයක් ඇතුළත්ව ශ්‍රී ලංකාව ඇතුළත දී 22අඈ වන වගන්තිය යටතේ යම් වරදක් සිදු කරන හෝ ඒ යටතේ සාදන ලද යම් රීතියක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගෙන නිසි අධිකරණ බලය සහිත මහාධිකරණය වෙත එම තැනැත්තා ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නිලධරයන් වෙත බලතල පැවරීම,

වේ.

***21 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඊ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 11 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***22 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඒ වන වන වගන්තියට ඉක්බිතිව ම IIඇ වන නව කොටස (22ඔ වන සහ 22ඕ වන වගන්ති) ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, අවස්ථාවෝචිත පරිදි, 17 වන, 17ආ වන, 21 වන හෝ 22 වන වගන්තිය යටතේ ක්‍රියාකරුවකු, සැපයුම්කරුවකු හෝ බලපත්‍රලාභියකු විසින් ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුව හෝ 22උ වන වගන්තිය යටතේ ක්‍රියාකරුවකු විසින් ගෙවිය යුතු සෙස් බද්ද ගෙවීම පැහැර හරින ලද අවස්ථාවක, එම ක්‍රියාකරු හෝ සැපයුම්කරු විසින් ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුව හෝ සෙස් බද්ද මත අධිභාරයක් පැනවීම සඳහා විධිවිධාන සැලස්වීම වේ.

***23 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන, 34 වන සහ 35 වන වගන්ති සංශෝධනය කරනු ලබන අතර, 13 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***24 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියට ඉක්බිතිව ම 35අ වන සහ 35ආ නව වගන්ති ඇතුළත් කිරීම මගින් ඒ ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, ක්‍රියාකරුවන් එකිනෙකා අතර සහ වෙනත් පුද්ගල මණ්ඩල සමඟ පහසුකම් සහ සම්පත් හවුලේ බෙදා ගැනීමට හැකි කරවීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***25 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන සහ 37 වන වගන්ති සංශෝධනය කරනු ලබන අතර, 13 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***26 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, 13 වන වගන්තිය සහ 24 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

***27 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන සහ 40 වන වගන්ති සංශෝධනය කරනු ලබන අතර, 13 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***28 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියට 22අඇ වන සහ 22අඈ වන අලුත් වගන්ති ඇතුළත් කරමින් 20 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*29 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ-

(අ) 19 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 22 වන වගන්තිය යටතේ වරදකරුවකු වන තැනැත්තකු මත පනවනු ලබන දඬුවම වැඩි කිරීම සහ වරද අඛණ්ඩව සිදු කරනු ලබන අවස්ථාවක දී අමතර දඩයක් හඳුන්වා දීම;

(ආ) 19 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වරදක් කිරීම සඳහා භාවිත කරන ලද විදුලි සංදේශ උපකරණ මහෙස්ත්‍රාත්වරයා විසින් රාජසන්තක කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම; සහ

(ඇ) 17ආ වන වගන්තිය යටතේ වරදකට වරදකරු වන තැනැත්තකු සඳහා දණ්ඩනයක් හඳුන්වා දීම සඳහා විධිවිධාන සැලැස්වීම,

වේ.

*30 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියට ඉක්බිතිව ම 46අ වන, 46ආ වන සහ 46ඇ වන නව වගන්ති ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ-

(අ) විදුලි සංදේශ ක්‍රමයකට බාධා කිරීම, කඩා බිඳ දැමීම හෝ අවහිර කිරීම වරදක් බවට පත් කිරීම;

(ආ) විදුලි සංදේශ ක්‍රමයක් භාවිත කරමින් තැනැත්තකු රැවටීම හෝ නොමග යැවීම වරදක් බවට පත් කිරීම; සහ

(ඇ) විදුලි සංදේශ සේවාවක් භාවිත කරන්නකුගේ අනන්‍යතාවය පිළිබඳ අසත්‍ය තොරතුරු ලබා දීම වරදක් බවට පත් කිරීම,

වේ.

*31 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතියේ බලපෑම වනුයේ, ප්‍රධාන ප්‍රඥප්තියට 22අඇ වන නව වගන්තිය ඇතුළත් කරමින් 20 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වන අතර, සමුද්‍රාන්ත කේබලය හෝ සමුද්‍රාන්ත කේබල් ගොඩබිමට සම්බන්ධ කරන ස්ථානයන් ආදිය සඳහා අලාභහානි සිදු කිරීමේ වරදට වරදකරු වන තැනැත්තකු සඳහා වූ දණ්ඩනය හඳුන්වා දීම සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම වේ.

*32 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) පීඩාවක් හෝ හිරිහැරයක් සිදු කිරීම පිණිස දුරකථනයක් භාවිතයෙන් නිරන්තරයෙන් පණිවිඩ යැවීම හෝ ප්‍රේෂණය කිරීම හෝ වෙනත් ග්‍රාහකයන්ගේ දුරකථන අංක ප්‍රසිද්ධ කිරීම, යැවීම හෝ ප්‍රේෂණය කිරීම, වරදක් බවට පත් කිරීම; සහ

(ආ) එම වගන්තිය යටතේ වරදක් සිදු කිරීම සඳහා භාවිත කරන ලද දුරකථන සම්බන්ධතාවන් විසන්ධි කිරීමට විදුලි සංදේශ නිලධරයකුට හැකි කරවීම සඳහා විධිවිධාන සැලැස්වීම,

වේ.

*33 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියට ඉක්බිතිව ම 59අ වන සහ 59ආ වන නව වගන්ති ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ-

(අ) දුරකථනයක් භාවිතයෙන් මහජන කැළඹීම් ඇති කිරීම හෝ මහජන සාමය කඩ කිරීම වරදක් බවට පත් කිරීමට සහ ඊට දණ්ඩනයක් නිශ්චිතව දැක්වීමට විධිවිධාන සැලසීම; සහ

(ආ) කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාව විසින් ඊට සහාය වීම සඳහා පත් කරන ලද වෙනත් නිලධරයකුට අසත්‍ය හෝ නොමඟ යවනසුලු තොරතුරු ලබා දීම හෝ ලබා දීමට සැලැස්වීම වරදක් බවට පත් කිරීමට සහ ඊට දණ්ඩනයක් නිශ්චිතව දැක්වීමට විධිවිධාන සැලැස්වීම,

වේ.

*34 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කිරීම සඳහා භාවිත කරන ලද විදුලි සංදේශ උපකරණ රජය සතු කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයාට බලය ලබා දීම වේ.

*35 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) අදාළ ක්‍රියාකරුවන්, සැපයුම්කරුවන් සහ බලපත්‍රලාභීන් සඳහා අදාළ වන චර්යා සංග්‍රහ සකස් කිරීම සඳහා;

(ආ) ක්‍රියාකරුවන්, සැපයුම්කරුවන් සහ බලපත්‍රලාභීන් විසින් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ, කලින් කල නිකුත් කිරීම සඳහා; සහ

(ඇ) ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමනාකරණය කිරීම සඳහා,

කොමිෂන් සභාවේ රීති සෑදීමේ බලතල ව්‍යාප්ත කිරීම වේ.

*36 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ, "යුධ හමුදාව", "කේබල් ගොඩබිමට සම්බන්ධ කරන ස්ථාන", "වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව", "ස්ව සම්පත් කලාපය", "යටිතල පහසුකම්", "තැනැත්තා", "පොලිස් නිලධරයා", "සැපයුම්කරු", "ගුවන්විදුලි ප්‍රවේශ ජාලය", "ගුවන්විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ", "ශ්‍රී ලංකා ගුවන් හමුදාව", ශ්‍රී ලංකා නාවික හමුදාව" සහ "සමුද්‍රාන්ත කේබල්" යන යෙදුම් සඳහා නව අර්ථ නිරූපණ එම වගන්තියට ඇතුළත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

එල්.ඩී.-ඕ.9/2024

# 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2024 අංක      දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1991 අංක 25 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "තමා සතු බලතල" සහ "තමා සලකන ආකාරයට" යන වචන වෙනුවට පිළිවෙළින් "එහි බලතල" සහ "එය සලකනු ලබන ආකාරයට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (ආ) වන ඡේදයේ "ක්‍රියාකරුවකුගේම" යන වචනය වෙනුවට "ක්‍රියාකරුවකුගේ ම සහ සැපයුම්කරුවකුගේ ම" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (ඊ) වන ඡේදයේ "ක්‍රියාකරුවන්ට" යන වචනය වෙනුවට "ක්‍රියාකරුවන්ට සහ සැපයුම්කරුවන්ට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ආ) වන ඡේදයේ "විදුලි සංදේශ ක්‍රම ක්‍රියා කරවීම" යන වචන වෙනුවට "ක්‍රියාකරුවන්ට" යන වචනය ආදේශ කිරීමෙන්;

(2) එහි (ඇ) වන ඡේදයේ "ක්‍රියාකරුවකු" යන වචනය වෙනුවට "ක්‍රියාකරුවකු සහ සැපයුම්කරුවකු" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (උ) වන සහ (ඌ) වන ඡේදවල "ක්‍රියාකරුවකු" සහ "ක්‍රියාකරුවන්" යන වචන වෙනුවට පිළිවෙළින් "ක්‍රියාකරුවකු සහ සැපයුම්කරුවකු" සහ "ක්‍රියාකරුවන් සහ සැපයුම්කරුවන්" යන වචන ආදේශ කිරීමෙන්;

(4) එහි (ඔ) වන ඡේදයේ -

(අ) "ගාස්තු ක්‍රම හෝ ගාස්තු ක්‍රම තීරණය කිරීමේ ක්‍රම නිශ්චය කිරීම" යන වචන වෙනුවට "6අ වන වගන්තිය යටතේ ගාස්තු ක්‍රම හෝ එම ගාස්තු ක්‍රම අනුමත කිරීමේ හෝ නිශ්චය කිරීමේ ක්‍රම නිශ්චය කිරීම" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්; සහ

(ආ) "ක්‍රියාකරුවන්" යන වචනය වෙනුවට "එම ඡේදයේ එම වචනය යෙදී ඇති සෑම ස්ථානයක ම "ක්‍රියාකරුවන් සහ සැපයුම්කරුවන්" යන වචන ආදේශ කිරීමෙන්;

(5) එහි (ක) වන ඡේදයේ "විදුලි සංදේශ ක්‍රමවල ක්‍රියාකරුවන්ට" යන වචන වෙනුවට "ක්‍රියාකරුවන්ට සහ සැපයුම්කරුවන්ට" යන වචන ආදේශ කිරීමෙන්;

(6) එහි (ඛ) වන ඡේදයේ "ක්‍රියාකරුවන්" යන වචන වෙනුවට "ක්‍රියාකරුවන් සහ සැපයුම්කරුවන්" යන වචන ආදේශ කිරීමෙන්;

(7) එහි (ප) වන ඡේදයේ "ඒවා පිළිපදින ලෙස බලකිරීම;" යන වචන වෙනුවට "ඒවා පිළිපදින ලෙස බලකිරීම;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(8) එහි (ප) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:-

"(පඅ) විදුලි සංදේශ සේවා සැපයීමේ දී විශේෂිත වෙළඳපොළක් තුළ තරගකාරී මට්ටම අවබෝධ කර ගැනීම සඳහා එම වෙළඳපොළේ ගතිකතාවයන් පරීක්ෂා කිරීමට වෙළඳපොළ විශ්ලේෂණයක් සිදු කිරීම;

(පආ) සුවිශේෂී වෙළඳපොළ බලය මතු වීම හෝ අනිසි ලෙස භාවිත කිරීම වැළැක්වීම සඳහා මැදිහත් වීම;

(පඇ) සාධාරණ තරගකාරීත්වය ප්‍රවර්ධනය කර ප්‍රති-තරඟකාරී පරිචයන් තුරන් කිරීම සඳහා නියාමන පියවර ගැනීම;

(පඈ) නිශ්චිතව සඳහන් කරන ලද අවම මට්ටමේ සේවාවන් විශ්වීයව පවත්වා ගැනීම වැනි සමාජයීය ප්‍රතිපත්ති අභිප්‍රායන් අත්කර ගැනීම සඳහා සුදුසු සහ අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකා බලනු ලබන යම් පියවර ගෙන යම් විධාන නිකුත් කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියට 6අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 6අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු යː-

"කොමිෂන් සභාව විසින් ගාස්තු ක්‍රම අනුමත කිරීම හෝ නිශ්චය කිරීම

6අ. (1) කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන මූලධර්ම මත පදනම්ව ගාස්තු ක්‍රම අනුමත කිරීම හෝ නිශ්චය කිරීම කළ යුතු යː-

(අ) ගාස්තු ක්‍රම වෙනස් කොට සැලකීම නොකළ යුතු ය;

(ආ) ගාස්තු ක්‍රම, පිරිවැය මත පදනම් විය යුතු අතර, සාමාන්‍යයෙන් හරස් සහනාධාර බැහැර කළ යුතු ය; සහ

(2) (1) වන උපවගන්තියේ (අ) වන සහ (ආ) වන ඡේදවලට යටත්ව, ක්‍රියාකරුවකු හෝ සැපයුම්කරුවකු විසින් ගාස්තු ක්‍රම හෝ ගාස්තු ක්‍රම සඳහා ගැළපුම් යෝජනා කළ හැකි ය.

(3) ක්‍රියාකරුවකු හෝ සැපයුම්කරුවකු විසින් ගාස්තු ක්‍රම හෝ ගාස්තු ක්‍රම සඳහා ගැළපුම් යෝජනා කරන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්-

(අ) රජයේ ප්‍රතිපත්ති සහ කර්මාන්ත නියම; සහ

(ආ) භාවිතකරුවන්ගේ විශේෂිත පන්තියකට හෝ විශේෂිත ප්‍රදේශයකට ක්‍රියාකරුවා හෝ සැපයුම්කරුවා විසින් සපයන පහසුකම් හෝ සේවා,

සැලකිල්ලට ගනිමින්, (1) වන උපවගන්තියට යටත්ව, එම ගාස්තු ක්‍රම හෝ ගාස්තු ක්‍රම සඳහා ගැළපුම් අනුමත කිරීම හෝ අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීම කළ හැකි යඃ

එසේ වුව ද, ක්‍රියාකරුවකු හෝ සැපයුම්කරුවකු විසින් යෝජනා කරන ලද යෝජිත ගාස්තු ක්‍රමයක් හෝ ගාස්තු ක්‍රම සඳහා වන ගැළපීමක් කොමිෂන් සභාව විසින් අර්ධ වශයෙන් අනුමත කිරීම කළ හැකි අතර, කොමිෂන් සභාව විසින් පනවන ලද යම් කොන්දේසිවලට යටත්ව එම අනුමතය ප්‍රදානය කළ හැකි ය.

(4) යම් සේවාවක් සඳහා වන යම් ගාස්තු ක්‍රමයක්, යම් කොන්දේසිවලට යටත්ව හෝ කොන්දේසි විරහිතව සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් අනුමත කර ගැනීම අවශ්‍ය නොවන බවට කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකි ය.

(5) සාමාන්‍යයෙන් හෝ ක්‍රියාකරුවකු හෝ සැපයුම්කරුවකු විසින් සපයනු ලබන යම් විශේෂිත විදුලි සංදේශ සේවාවක් සඳහා හෝ ගාස්තු ක්‍රම ගැළපුම් සකස් කිරීමේ, සමාලෝචනය කිරීමේ, ප්‍රකාශයට පත් කිරීමේ, අනුමත කිරීමේ ආකාරය ඇතුළත් විය යුතු විශේෂිත ගාස්තු ක්‍රම සැලසුමක් සඳහා කොමිෂන් සභාව විසින්, අමාත්‍යවරයා විමසා, රීති මාර්ගයෙන් විධිවිධාන සලසනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තිය යටතේ කොමිෂන් සභාවෙන් ගාස්තු ක්‍රම සැලසුම සඳහා අනුමතය ලබා ගැනීමකින් තොරව ක්‍රියාකරුවකු හෝ සැපයුම්කරුවකු විසින් යම් විදුලි සංදේශ සේවාවක් සැපයීම නොකළ යුතු ය.

(7) (6) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන සෑම ක්‍රියාකරුවකු ම හෝ සැපයුම්කරුවකු ම වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, එහි "ක්‍රියාකරුවා" යන වචනය යෙදී ඇති ඕනෑම ස්ථානයක් සඳහා අවස්ථාවෝචිත පරිදි, " ක්‍රියාකරුවා හෝ සැපයුම්කරුවා" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එහි "සෑම ක්‍රියාකරුවකුම" යන වචන වෙනුවට "සෑම ක්‍රියාකරුවකු ම සහ සැපයුම්කරුවකු ම" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "ක්‍රියාකරුවකු" යන වචනය වෙනුවට ක්‍රියාකරුවකු හෝ සැපයුම්කරුවකු" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (2) වන උපවගන්තියේ "ඒ ක්‍රියාකරුට" යන වචන වෙනුවට "ඒ ක්‍රියාකරුට හෝ සැපයුම්කරුට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 9අ වන වගන්තිය ඇතුළත් කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 9අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු යː-

"ප්‍රති-තරගකාරීත්ව පරිචයන් ආදිය සම්බන්ධයෙන් ආරවුල් නිරවුල් කිරීම

9අ. (1) කොමිෂන් සභාව විසින්,-

(අ) යම් ප්‍රති-තරගකාරී පරිචයක් පවතින බවට හෝ පවතින බව අවබෝධ කර ගැනීමක්;

(ආ) අත්පත් කර ගැනීම, ක්‍රියාකරුවකු හෝ සැපයුම්කරුවකු විසින් ක්‍රියාත්මක කරනු ලබන විදුලි සංදේශ සේවාවක් ක්‍රියාත්මක වන වෙළඳපොළක හෝ ඊට වැඩි සංඛ්‍යාවක තත්ත්වයට බලපෑමක් සිදු විය හැකි ප්‍රමුඛ තත්ත්වයක (සුවිශේෂී වෙළඳපොළ බලය) අනිසි පැවතීමක් හෝ අනිසි පැවතීමක් පවතින බවට අවබෝධ කර ගැනීමක්;

(ඈ) ඒකාබද්ධ කිරීමේ තත්ත්වයක් ගොඩනඟා ගැනීම හෝ ගොඩනඟාගෙන ඇති බවට අවබෝධ කර ගැනීම; හෝ

(ඈ) සාධාරණව සහ පිරිවැය මත පදනම් වූ සහ අසාධාරණයකට ලක් නොවන නියම සහ කොන්දේසි මත වෙළඳපොළ ජාලයට ප්‍රවේශ වීමට අයිතිය නොමැති වීමක්,

සම්බන්ධයෙන්, සිය මෙහෙයවීමෙන් හෝ යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලබන පැමිණිල්ලක් හෝ ඉල්ලීමක් මත කොමිෂන් සභාව විසින් සුදුසු යයි සිතිය හැකි පරිදි වන ආකාරයකට විමර්ශනයක් සිදු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සිදු කරනු ලබන යම් විමර්ශනයක් සඳහා යටත් වන යම් ක්‍රියාකරුවකුට හෝ සැපයුම්කරුවකුට කරුණු කියාපෑමට අවස්ථාවක් සහ ලේඛන සාක්ෂි ඉදිරිපත් කිරීමට අවස්ථාවක් කොමිෂන් සභාව විසින් ලබා දිය හැකි ය.

(3) විමර්ශනයක් පැවැත්වීමෙන් පසුව (අ) වන, (ආ) වන, (ඇ) වන හෝ (ඈ) වන ඡේදයක නිශ්චිතව දක්වා ඇති අවස්ථාවලින් යම් එක් අවස්ථාවක් පවතින බවට සහ එහෙත් එම අවස්ථාව මහජන යහපතට එරෙහිව ක්‍රියාත්මක නොවන බවට හෝ ක්‍රියාත්මක විය නොහැකි බවට කොමිෂන් සභාව සෑහීමට පත් වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, තත්කාර්ය සඳහා සිදු කරනු ලබන නියමයක් මගින් (අ) වන, (ආ) වන, (ඇ) වන හෝ (ඈ) වන ඡේදයක නිශ්චිතව සඳහන් කරන ලද අවස්ථාවලින් කිසියම් අවස්ථාවක් කුමන අයුරින් හෝ වෙළඳපොළක දී වෙනත් ක්‍රියාකරුවන් සහ සැපයුම්කරුවන් වෙත අහිතකර බලපෑම් ඇති කිරීමක් පවතී නම් ඒවාට පිළියම් යොදා වැළැක්වීමේ කාර්ය සඳහා අවශ්‍ය හෝ සුදුසු යයි කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකි යම් නියමයන්ට

සහ කොන්දේසිවලට යටත්ව, එවැනි අවස්ථාවක් පවත්වාගෙන යාමට කොමිෂන් සභාව විසින් අවසර දෙනු ලැබිය යුතු ය.

(4) විමර්ශනයකින් පසුව (අ) වන, (ආ) වන, (ඇ) වන හෝ (ඈ) වන ඡේදයක නිශ්චිතව දක්වා ඇති අවස්ථාවලින් එක් අවස්ථාවක් පවතින බවට සහ මහජන යහපතට එරෙහිව එම අවස්ථාව ක්‍රියාත්මක වන බවට හෝ ක්‍රියාත්මක විය හැකි බවට කොමිෂන් සභාව විසින් අනාවරණය කර ගනු ලබන අවස්ථාවක, එයින් උද්ගත වන අහිතකර බලපෑම් නිවැරදි කිරීමේ හෝ වැළැක්වීමේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් එවැනි යම් අවස්ථාවක් පැවතීම වළක්වමින් සුදුසු නියමයක් සිදු කරනු ලැබිය යුතු ය.

(5) විමර්ශනයකින් පසුව (අ) වන, (ආ) වන, (ඇ) වන හෝ (ඈ) වන ඡේදයක නිශ්චිතව දක්වා ඇති අවස්ථාවලින් එක් අවස්ථාවක් පවතින බවට කොමිෂන් සභාව විසින් අනාවරණය කරනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, අවශ්‍ය අවස්ථාවල දී, (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන පිළිබඳව සැලකිල්ලට ගනිමින් (3) වන සහ (4) වන උපවගන්තිවල දක්වා ඇති නියමවලට අමතර යම් උචිත නියමයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(6) පහත කරුණු සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි යඃ-

(අ) සාධාරණ තරගකාරීත්වය ප්‍රවර්ධනය කිරීමේ, වෙළඳපොළ වෙනස් කිරීම් නතර කිරීමේ සහ පාරිභෝගික යහපත ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව කොමිෂන් සභාව විසින් නිර්වචනය කරනු ලැබිය හැකි පරිදි සුවිශේෂී වෙළඳපොළ බලය ඇති ක්‍රියාකරුවන්ට සහ සැපයුම්කරුවන්ට නිශ්චිත වගකීමක් පැවරීම සඳහා; සහ

(ආ) වෙනස්කොට සැලකීමක් නොමැති ප්‍රවේශයක් සඳහා පහසුකම් සැලසීම සහ සියලු ක්‍රියාකරුවන්ට සහ සැපයුම්කරුවන්ට සමාන අවස්ථාවන් ලබා දීමට සහතික වීම සඳහා.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීම මගින් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“(1අ) කොමිෂන් සභාවට-

(අ) කොමිෂන් සභාව විසින් සුදුසු යයි අදහස් කරන පරිදි ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලියේ යම් කොටසක් කලාප සංඛ්‍යාවකට වෙන් කිරීම සඳහා සහ වෙන් කර දීම සඳහා සහ එක් එක් කලාප භාවිත කරනු ලැබිය හැකි සේවාව හෝ කාර්යය නිශ්චිතව දැක්වීම සඳහා;

(ආ) සංඛ්‍යාත නාලිකා සැලසුම් නිශ්චිතව දැක්වීම සඳහා; සහ

(ඇ) 22 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට ගුවන්විදුලි සන්නිවේදන උපකරණ භාවිත කරන්නන්ට ගුවන්විදුලි සංඛ්‍යාත හෝ ගුවන්විදුලි සංඛ්‍යාත යම් කලාපයක් පවරා දීම සඳහා,

බලතල තිබිය යුතු ය.

(1ආ) කොමිෂන් සභාව විසින්, අවලංගු කිරීමේ අයිතියට යටත්ව, තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් නියම සහ කොන්දේසිවලට යටත්ව, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇති කාල පරිච්ඡේදයක් සඳහා 22 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති යම් කාර්යයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන යම් තැනැත්තකුට ගාස්තුවක් ගෙවීම මත සංඛ්‍යාත වෙන් කර ගැනීමේ බලපත්‍රයක් කොමිෂන් සභාව විසින් නිකුත් කළ හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 10අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු යː-

“අංක ආදිය වෙන් කර දීම සහ භාවිත කිරීම සම්බන්ධයෙන් පරම අධිකාරය කොමිෂන් සභාව විය යුතු බව

10අ. (1) අංක, නාමයන්, කේත සහ හඳුන්වනයන් භාවිත කිරීම කළමනාකරණය කිරීමට බලතල පැවරී ඇති පරම අධිකාරය කොමිෂන් සභාව වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අංක, නාමයන්, කේත සහ හඳුන්වනයන් කාර්යක්ෂම ලෙස වෙන් කර දීම ප්‍රවර්ධනය කිරීම සඳහා කොමිෂන් සභාව වගකිව යුතු ය.

(3) කොමිෂන් සභාවට-

(අ) අදාළ සැලසුම් අනුව අංක, අංක කාණ්ඩයක් හෝ අංක කාණ්ඩ, කේත සහ නාමයන් පවරා දීමට;

(ආ) අංකයක් හෝ අංක කාණ්ඩයක් හෝ අංක කාණ්ඩ හෝ කේත භාවිත කිරීමේ අයිතිය බද්දට දීමට හෝ විකිණීමට අනුමතය ප්‍රදානය කිරීමට;

(ඇ) අංකනය කිරීම, නාමයන්, කේත සහ හඳුන්වනයන් සඳහා එසේ සකස් කරන ලද සැලසුම් සංශෝධනය කිරීම;

(ඈ) (i) එසේ පවරන ලද අංක, අංක කාණ්ඩය හෝ අංක කාණ්ඩ, සංකේත සහ නම් භාවිත කිරීම සඳහා ගාස්තු නිශ්චිතව දක්වමින්;

(ii) අදාළ සැලසුම්වල අංක, නාමයන්, කේත සහ හඳුන්වනයන් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන්; සහ

(iii) මේ වගන්තිය යටතේ පවරන ලද අංක, අංක කාණ්ඩයක් හෝ අංක කාණ්ඩ, කේත සහ නාමයන් ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් වන කොන්දේසි නිශ්චය කිරීම සඳහා,

රීති සෑදීමට; සහ

(ඉ) (i) මේ වගන්තිය යටතේ වෙන් කර දෙන ලද අංක, නාමයන්, කේත සහ හඳුන්වනයන් උපයෝගී කර ගැනීම සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කරන ලෙස; සහ

(ii) අංක, නාමයන්, කේත සහ හඳුන්වනයන් භාවිත කිරීම සඳහා අදාළ සැලසුම්වලට අනුගත වන ලෙස,

යම් තැනැත්තකුට විධාන නිකුත් කිරීම,

ඇතුළත්ව අංක, නාමයන්, කේත සහ හඳුන්වනයන් භාවිත කිරීම සඳහා වන සැලසුම් සකස් කිරීමට, නිශ්චය කිරීමට, ප්‍රසිද්ධ කිරීමට සහ පරිපාලනය කිරීමට බලතල තිබිය යුතු ය.

(4) අංක වෙනස් කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා කොමිෂන් සභාවට බලතල තිබිය යුතු අතර, එසේ ක්‍රියාත්මක කිරීම සඳහා රීති, මාර්ගෝපදේශ සහ විධාන ක්‍රියාකරුවන්ට නිකුත් කිරීමට කොමිෂන් සභාවට බලතල තිබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ අංක, කේත, අංක කාණ්ඩයක් හෝ අංක කාණ්ඩ, අංක කේතයක් හෝ අංක කේත පවරා දෙනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා වෙත පූර්ව ලිඛිත දැනුම් දීමක් මගින් එම තැනැත්තාට කරුණු කියාපෑමට අවස්ථාවක් ලබා දීමෙන් පසුව, එම පවරන ලද අංක, කේත, අංක කාණ්ඩයක් හෝ අංක කාණ්ඩ, අංක කේතය හෝ අංක කේත කොමිෂන් සභාව විසින් ඉවත් කර ගනු ලැබිය හැකි ය.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තියේ "විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියා කරවීමට 17 වන වගන්තිය යටතේ බලපත්‍රයක් මගින් බලය දෙනු ලැබූ" යන වචන සහ ඉලක්කම් වෙනුවට

"17 වන වගන්තිය හෝ 17අා වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එහි (4) වන සහ (5) වන උපවගන්තිවල "ක්‍රියාකරු වෙත" යන වචන වෙනුවට "ක්‍රියාකරු හෝ සැපයුම්කරු වෙත" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(6) 17 වන වගන්තිය හෝ 17අා වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කළ තැනැත්තකු (2) වන උපවගන්තිය යටතේ නිකුත් කළ නියමයකට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක, ඒ බලපත්‍රය මගින් බලය දෙන ලද කටයුත්තකින් උපචිත වන අදාළ වර්ෂයට ඉක්බිතිව ම වූ වර්ෂයේ වාර්ෂික පිරිවැටුමෙන් සියයට එකකට නොවැඩි දණ්ඩන මුදලක් ගෙවන ලෙසට කොමිෂන් සභාව විසින් එම තැනැත්තාට දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

(7) මේ වගන්තිය යටතේ පනවන ලද දණ්ඩන මුදල එකතු කිරීම සඳහා කොමිෂන් සභාව වගකිව යුතු අතර, එසේ එකතු කරන ලද දණ්ඩන මුදල 22ඊ වන වගන්තිය යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(8) (6) වන උපවගන්තිය ප්‍රකාරව දණ්ඩන මුදලකට යටත් වන යම් තැනැත්තකු එම දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි එම කාලසීමාව තුළ දී එම දණ්ඩන මුදල ගෙවීමට අපොහොසත් වන්නේ නම්, අය කර ගත යුතු දණ්ඩන මුදල ගෙවීමට නියම කිරීමේ ආඥාවක් ලබා ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් නිසි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත ඒක පාර්ශ්වීය ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එසේ ඉල්ලීමක්

කරනු ලැබූ විට, මහෙස්ත්‍රාත් අධිකරණය විසින් එහි සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී පනවනු ලැබිය හැකි දණ්ඩන මුදල ඉක්මවනු ලබන යම් මුදලක් බව නොතකා එම දණ්ඩන මුදල එම අධිකරණය විසින් පනවනු ලැබූ දඩ මුදලක් හා සමාන ආකාරයෙන් අය කර ගත යුතු ය.

(9) මේ වගන්තිය යටතේ පුද්ගල මණ්ඩලයකට දණ්ඩන මුදලක් පනවනු ලබන අවස්ථාවක-

(අ) ඒ පුද්ගල මණ්ඩලය, සංස්ථාපිත මණ්ඩලයක් වන විට, (6) වන උපවගන්තිය යටතේ අනුකූල නොවීම සිදුවන අවස්ථාවේ, ඒ සංස්ථාපිත මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය සම්බන්ධයෙන් වගකිව යුතු අධ්‍යක්ෂවරයකු සහ වෙනත් නිලධරයකු වූ සෑම තැනැත්තකු ම;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය, ව්‍යාපාර ආයතනයක් වන විට, එම ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකු ම; හෝ

(ඇ) ඒ මණ්ඩලය, සංස්ථාපිත මණ්ඩලයක් නොවන විට, (6) වන උපවගන්තිය යටතේ වන නියමයන් සමඟ අනුකූල නොවීම සිදුවන අවස්ථාවේ, එම මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධරයකු වන සෑම තැනැත්තකු ම,

(6) වන උපවගන්තිය යටතේ වන නියම සමග අනුකූල වීමට අපොහොසත් වීම පිළිබඳව ඔහුට දැනුම නොතිබුණ බව හෝ එම නියම සමඟ අනුකූල වීම තහවුරු කිරීම සඳහා ඔහු සියලු නිසි සැලකිල්ලෙන් සහ උද්යෝගයෙන් යුතුව ක්‍රියා කළ බව ඔප්පු කරන්නේ නම් මිස, එම දණ්ඩන මුදල ගෙවීම සඳහා යටත් විය යුතු ය.

(10) මේ වගන්තිය යටතේ දණ්ඩන මුදලක් පැනවීම මගින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එම ආඥාවට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(11) (10) වන උප වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන යම් තැනැත්තකු විසින්, (6) වන උපවගන්තිය යටතේ පනවන ලද දණ්ඩන මුදලට සමාන යම් මුදල් ප්‍රමාණයක් ඇපයක් වශයෙන් මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ මුදලින් තැන්පත් කරනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (6) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ “ඒ බලපත්‍රයේ තත්කාර්ය සඳහා අඩංගු යම් නියමයක් අනුව, එය කලින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත් හැර,” යන වචන වෙනුවට “17අ වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත් හැර,” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (9) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

“(10) මේ වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ යම් ක්‍රියාකරුවකුට ද, යම් ගුවන්විදුලි ප්‍රවේශ ජාලයක් ඇතුළත්ව එම ක්‍රියාකරු සතු හෝ එම ක්‍රියාකරු විසින් භාවිත කළ යම් පහසුකමක් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන ලද වෙනත් ක්‍රියාකරුවකු සමඟ මේ පනත යටතේ සාදන ලද රීති මගින් නිශ්චිතව දක්වන ලද යම් නියම සහ කොන්දේසිවලට යටත්ව භාවිත කිරීම බෙදා ගන්නා ලෙස එම ක්‍රියාකරුට විධාන නිකුත් කිරීමට කොමිෂන් සභාවට බලතල තිබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 17අ වන සහ 17ආ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති ඒ ප්‍රඥප්තියේ 17අ වන සහ 17ආ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු යː-

"17 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම

17අ. (1) 17 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක්, බලපත්‍රයේ නියම සහ කොන්දේසි කඩ කිරීම සහ මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ රීතියක යම් උල්ලංඝනය කිරීමක් මත, ඒ සඳහා හේතු දක්වා අමාත්‍යවරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයක් මගින් එම ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ දිනය (නියමය පළ කරනු ලබන දින සිට දින තිහකට වඩා පෙර නොවන දිනයක දී) නිශ්චිතව දක්වනු ලැබිය යුතු අතර, ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා වන හේතු ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ දිනයට දින පහළොවකට පෙර කොමිෂන් සභාව හරහා අදාළ ක්‍රියාකරුට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) ක්‍රියාකරුට බලපත්‍රයක් නිකුත් කරන ලද්දේ යම් විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද, මේ වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ට කර ඇති එම බලපත්‍රය අදාළ විදුලි සංදේශ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කරන ලද තාවකාලික කාර්ය ක්‍රමයක්, (2) වන උපවගන්තියේ සඳහන් නියමය මගින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් 17 වන වගන්තිය යටතේ වන බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන අවස්ථාවක, බලපත්‍රලාභියා විසින්, අමාත්‍යවරයාගේ තීරණය ඔහුට දැනුම් දුන් දින සිට දින තිහක කාලසීමාවක් ඇතුළත, ප්‍රත්‍යාදිෂ්ට කිරීමට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි අතර, අභියාචනාධිකරණය විසින් අමාත්‍යවරයාගේ තීරණය ස්ථිර කිරීම හෝ ඉවත දැමීම කරනු ලැබිය හැකි ය.

බලපත්‍රයක් නොමැතිව යම් කටයුතුවල නිරතවීම තහනම් බව

17ආ. (1) කොමිෂන් සභාව විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ හැර, තැනැත්තකු විසින් පහත දැක්වෙන කටයුතුවල නිරත නොවිය යුතු යː-

(අ) විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා නියමිත රීති මගින් නිශ්චිතව දක්වනු ලබන යටිතල පහසුකම් සේවා සැපයීම;

(ආ) රීති මගින් නිශ්චිතව දක්වනු ලබන විදුලි සංදේශ සේවා සැපයීම; හෝ

(ඇ) කේබල් ගොඩබිමට සම්බන්ධ කරන ස්ථාන පහසුකම් සැපයීම.

(2) (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදයේ කාර්යය සඳහා, පහසුකම් සඳහා ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය තුළ සවි කරන ලද සමුද්‍රාන්ත කේබල් ඇතුළත් විය යුතු ය.

(3) සමුද්‍රාන්ත කේබල් සඳහා ප්‍රවේශය ඇතුළත්ව කේබල් ගොඩබිමට සම්බන්ධ කරන ස්ථාන පහසුකම් සඳහා වන ගාස්තු කොමිෂන් සභාව විසින් අනුමත කළ යුතු ය; නැතහොත් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක්-

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වන යම් ආකෘතියකින් සහ යම් ගාස්තු ගෙවීමක් මත විය යුතු ය;

(ආ) එම බලපත්‍රයේ නිශ්චිතව දැක්විය හැකි පරිදි යම් නියම සහ කොන්දේසිවලට යටත්ව විය යුතු ය; සහ

(ඇ) කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ, සාදන ලද රීති මගින්, කලින් කල, නිශ්චය කරනු ලැබිය හැකි යම් තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූල වන ලෙස නියම කළ යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව (1) වන උපවගන්තියේ (අ) වන, (ආ) වන හෝ (ඇ) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් කටයුත්තක නිරත වන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(6) බලපත්‍රයක යම් නියම සහ කොන්දේසි කඩ කිරීම මත හෝ බලපත්‍රලාභියා විසින් නියමිත තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූල වීමට අපොහොසත් වීම මත කොමිෂන් සභාව විසින්, ඕනෑම අවස්ථාවක, මේ වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(7) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලබන හෝ (3) වන උපවගන්තිය යටතේ වන බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරු හෝ බලපත්‍රලාභියා විසින්, කොමිෂන් සභාවේ තීරණය ඔහුට දැනුම් දුන් දින සිට දින තිහක කාලසීමාවක් ඇතුළත, අවස්ථාවෝචිත පරිදි, ඒ ප්‍රතික්ෂේප කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි අතර, අභියාචනාධිකරණය විසින්, කොමිෂන් සභාවේ එම තීරණය ස්ථිර කිරීම හෝ ඉවත දැමීම කරනු ලැබිය හැකි ය.

(8) මේ පනත යටතේ-

(අ) (1) වන උපවගන්තිය යටතේ වන බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම් පත්‍රයක් යොමු කරන ආකාරය;

(ආ) (1) වන උපවගන්තිය යටතේ වන එක් එක් බලපත්‍ර වර්ග සඳහා ඉල්ලුම් පත්‍රයක් යොමු කිරීමට ඉල්ලුම්කරුවකු විසින් සම්පූර්ණ කළ යුතු නියමයන්;

(ඇ) බලපත්‍රයක වලංගු කාලසීමාව සහ බලපත්‍රයක් අලුත් කරන ආකාරය; සහ

(ඇ) බලපත්‍රයක් අත්හිටුවීම සඳහා හෝ අවලංගු කිරීම සඳහා වන සාධක,

නිශ්චිතව දක්වමින් රීති සාදනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) මේ වගන්තියේ "බලපත්‍රයක අඩංගු යම් කොන්දේසියක් මද වශයෙන් වෙනස් කරන ලෙස" යන වචන යෙදී ඇති ඕනෑම ස්ථානයක් සඳහා ම "බලපත්‍රයක් මද වශයෙන් වෙනස් කරන ලෙස" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(4) යම් බලත්‍රයක් මද වශයෙන් වෙනස් කිරීමක් මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ රීතියක විධිවිධාන කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, 17ආ වන වගන්තිය යටතේ නිකුත් කරන ලද එම බලපත්‍රය කොමිෂන් සභාව විසින් මද වශයෙන් වෙනස් කරනු ලැබිය හැකි ය."; සහ

(3) එහි පැති සටහනෙහි "17 වන වගන්තිය" යන වචනය සහ ඉලක්කම් වෙනුවට "17 වන සහ 17ආ වන වගන්ති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වන වගන්තිය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "කොමිෂන් සභාවේ පූර්ව අනුමතය නොලබා," යන වචන වෙනුවට "17ආ වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන සැපයීම් බලපත්‍රයක් නොමැතිව," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන සහ (3) වන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(2) සැපයුම්කරුවකු විසින් යම් විදුලි සංදේශ ක්‍රමයක් භාවිත කිරීම සඳහා ක්‍රියාකරුවකුගෙන් ඉල්ලා සිටින අවස්ථාවක, ක්‍රියාකරු විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව, තොග වෙළඳ සේවාවන් ඇතුළත්ව එම විදුලි සංදේශ ක්‍රමය භාවිත කිරීම සඳහා එම සැපයුම්කරුට අවසරය ලබා දිය යුතු ය."; සහ

(3) එහි (4) වන උපවගන්තියේ "රුපියල් දස දහසකට" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂයකට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 20අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 20අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු යː-

"විදුලි සංදේශ ක්‍රම අන්තර් සම්බන්ධනය කිරීම

20අ. (1) අන්තර් සම්බන්ධන කිරීම කාර්යක්ෂම විදුලි සංදේශ සේවාවක් සැපයීම සඳහා හෝ මහජන යහපත සඳහා අවශ්‍ය වන බවට කොමිෂන් සභාව සලකනු ලබන අවස්ථාවන්හි දී, ක්‍රියාකරුවකුට වෙනත් ක්‍රියාකරුවකු සමඟ ඔවුන්ගේ විදුලි සංදේශ ක්‍රම අතර අන්තර් සම්බන්ධනය කිරීම සඳහා එකඟ වන ලෙස කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි ය.

(2) ක්‍රියාකරුවන්ගේ විදුලි සංදේශ ක්‍රම අතර අන්තර් සම්බන්ධනය කිරීම සඳහා එකඟත්වයකට එළඹෙන ලෙස (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නියම කරන ලද එම ක්‍රියාකරුවන්ගේ විදුලි සංදේශ ක්‍රම, විදුලි සංදේශ සේවා සහ විදුලි සංදේශ උපකරණවලට එකිනෙකාට ප්‍රවේශ වීමට හැකි කර වීම ඔවුන්ගේ වගකීම වන්නේ ය.

(3) අන්තර් සම්බන්ධන එකඟවීමක ක්‍රියාකරුවන් සඳහා නිකුත් කරන ලද අදාළ බලපත්‍රවල නියම සහ කොන්දේසිවලට අනුකූලව එම අන්තර් සම්බන්ධන එකඟවීමට ඇතුළත් කළ යුතු නියම සහ කොන්දේසි සාකච්ඡා කළ යුතු අතර, තව ද, පහත දැක්වෙන කරුණු දැක්විය යුතු යː-

(අ) අන්තර් සම්බන්ධන එකඟවීමේ කොන්දේසි, එම අන්තර් සම්බන්ධන එකඟවීමේ පාර්ශ්වකරුවකු වන එක් එක් ක්‍රියාකරුවාට නිකුත් කරන ලද අදාළ බලපත්‍රවල කොන්දේසිවලට අනුකූල විය යුතු ය;

(ආ) එක් ක්‍රියාකරුවකුගේ විදුලි සංදේශ ක්‍රමයට සම්බන්ධ වූ පාරිභෝගිකයන්ට අන්තර් සම්බන්ධන එකඟවීමේ පාර්ශ්වකරුවකු වන වෙනත් ක්‍රියාකරුවකුගේ විදුලි සංදේශ ක්‍රමයට ද ප්‍රවේශ වීමට හැකියාව තිබිය යුතු ය;

(ඇ) අන්තර් සම්බන්ධන එකඟවීමේ පාර්ශ්වකරුවන් වන ක්‍රියාකරුවන් විසින් ඔවුන්ගේ අදාළ විදුලි සංදේශ ක්‍රමවල ගුණාත්මකභාවය සමාන මට්ටමකින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය;

(ඈ) අන්තර් සම්බන්ධන වැඩපිළිවෙළ කාර්යක්ෂම සහ සාධාරණ විය යුතු අතර, අන්තර් සම්බන්ධන එකඟවීමක පාර්ශ්වකරුවන් විසින් ශක්‍යතාවය, අතුරු මුහුණත් සහ තාක්ෂණික ප්‍රමිතීන් සම්බන්ධයෙන් වෙනස් කොට නොසැලකීමේ පදනම මත සේවාවන් සපයනු ලබන බවට සහතික විය යුතු ය;

(ඉ) අන්තර් සම්බන්ධන සේවාවන් සපයනු ලබන්නේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද, එම නියම සහ කොන්දේසි ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා ලද යහ පරිචයන් පිළිබිඹු කරනු ලැබිය යුතු ය;

(ඊ) අන්තර් සම්බන්ධන සේවාවන් ඵලදායීත්වය සහ තිරසාර තරගකාරීත්වය සහතික කරනු ලැබිය යුතු ය; සහ

( උ) සේවාවන් සඳහා වන අන්තර් සම්බන්ධන අනුප්‍රමාණ, පිරිවැය නැඹුරුතාවයෙන් යුතු විය යුතු අතර, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ක්‍රමවේදයට යටත් විය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, අවශ්‍ය අවස්ථාවක, අන්තර් සම්බන්ධන එකඟ වීමකට ඇතුළත් කළ යුතු නියම සහ කොන්දේසි නිශ්චිතව දැක්විය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ අන්තර් සම්බන්ධන එකඟවීමක පාර්ශ්වකරුවන් විසින් මේ පනත යටතේ නිකුත් කරන ලද අදාළ බලපත්‍රය උල්ලංඝනය කරමින් ප්‍රති-තරගකාරී පරිචයක් වෙත යොමු වී තිබෙන බවට කොමිෂන් සභාව විසින් සෑහීමට පත් වන අවස්ථාවක, හෝ එම කරුණ සම්බන්ධයෙන් තෙවන පාර්ශ්වයකගෙන් පැමිණිල්ලක් ලැබෙන අවස්ථාවක කොමිෂන් සභාව විසින් අන්තර් සම්බන්ධන එකඟවීමේ පාර්ශ්වකරුවන් වෙත සාධාරණ දැන්වීමක් ලබා දීමෙන් පසුව, ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කරනු ලැබිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ පවත්වනු ලබන විමර්ශනයක විෂයය වන අන්තර් සම්බන්ධන එකඟවීමේ පාර්ශ්වකරුවන් වෙත කොමිෂන් සභාව විසින්, කරුණු කියාපෑමට සහ යම් ලේඛනමය සාක්ෂියක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දිය යුතු ය.

(7) විමර්ශනයෙන් පසුව ප්‍රති-තරගකාරී පරිචයක් පවතින බවට කොමිෂන් සභාව සෑහීමට පත් වන අවස්ථාවක, ඒ ප්‍රති-තරගකාරී පරිචය වළක්වාලීමට අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් පියවර ගන්නා ලෙස කොමිෂන් සභාව විසින් අන්තර් සම්බන්ධන එකඟවීමේ පාර්ශ්වකරුවන්ට විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, එම විධාන බලාත්මක කිරීම සඳහා අන්තර් සම්බන්ධන ගිවිසුම සංශෝධනය කිරීමට නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(8) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් පනවන ලද නියමයන් සමග අනුකූල වීමට යම් ක්‍රියාකරුවකු විසින් අපොහොසත් වන අවස්ථාවක, එම ක්‍රියාකරුගේ විදුලි සංදේශ ක්‍රමයට, විදුලි සංදේශ සේවාවට සහ විදුලි සංදේශ උපකරණවලට ප්‍රවේශ වීම බලාපොරොත්තු වන වෙනත් යම් ක්‍රියාකරුවකු විසින් එම අපොහොසත් වීම පිළිබඳව කොමිෂන් සභාවට දැනුම් දෙනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාව විසින් එම තොරතුරු ලද දින සිට වැඩකරන දින තිහක් ඇතුළත, ක්‍රියාකරුවන් දෙදෙනාම විමසා අන්තර් සම්බන්ධන සේවාවන්ට ප්‍රවේශ වීම සහ එම සේවය සඳහා අය කර ගත යුතු ගාස්තු ඇතුළත්ව යෝජිත අන්තර් සම්බන්ධන එකඟවීමේ නියම සහ කොන්දේසි නිශ්චය කරනු ලැබිය යුතු ය.

(9) මේ වගන්තිය යටතේ අන්තර් සම්බන්ධන එකඟවීමකට එළඹීමට යෝජිත ක්‍රියාකරුවන් (8) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් සිදු කරන ලද නිශ්චය කිරීමෙන් බැඳී සිටිය යුතු ය.

(10) කොමිෂන් සභාව විසින් (8) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද නිශ්චය කිරීම සමග අනුකූල වීමට අපොහොසත් වන යම් ක්‍රියාකරුවකු වරදක් කරනු ලබන අතර, රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර, වරද අඛණ්ඩව සිදු කරනු ලබන අවස්ථාවක, වරදකරු කිරීමෙන් පසුව එසේ වරද කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් ලක්ෂ තුන බැගින් වන අමතර දඩයකට යටත් විය යුතු ය.

(11) (8) වන උපවගන්තිය යටතේ නිශ්චය කිරීමෙන් අතෘප්තියට පත් යම් ක්‍රියාකරුවකු විසින්, එම නිශ්චය කිරීමට එරෙහිව එම නිශ්චය කිරීමේ දින සිට දින තිහක් ඇතුළත අභියාචනාධිකරණයට අභියාචනය කළ හැකි ය.

(12) කොමිෂන් සභාව විසින්:-

(අ) අන්තර් සම්බන්ධන එකඟ වීමකට ඇතුළත් කළ යුතු නියම සහ කොන්දේසි නිශ්චිතව දැක්වීම සඳහා;

(ආ) සේවාවන් සඳහා අන්තර් සම්බන්ධන අනුප්‍රමාණ සම්බන්ධයෙන් වන ක්‍රමවේදය නිශ්චය කිරීම සඳහා; සහ

(ඇ) අන්තර් සම්බන්ධන එකඟවීමක් ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර් සම්බන්ධන එකඟවීමේ පාර්ශ්වකරුවන් වෙත මාර්ගෝපදේශ සහ විධාන නිකුත් කිරීම සඳහා,

රීති සාදනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "ආනයනය කිරීම" යන වචන වෙනුවට "ආනයනය කිරීම, අපනයනය කිරීම" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (5) වන උපවගන්තියේ "රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට" යන වචනවලින් ආරම්භ වී ඒ වගන්තියේ අවසානය දක්වා වන වචන වෙනුවට "රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් වන්නේ ය. වරද අඛණ්ඩව සිදු කරනු ලබන අවස්ථාවක, වරදකරු කිරීමෙන් පසුව එසේ වරද සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් එක්දහස් පන්සියයක දඩයකට ඔහු යටත් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ යම් ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් භාවිත කිරීම" යන වචන වෙනුවට "යම් ගුවන්විදුලි සංඛ්‍යාතයක් භාවිත කිරීම හෝ යම් ගුවන්විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් භාවිත කිරීම හෝ සන්තකයේ තබා ගැනීම" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ "කොමිෂන් සභාව විසින් තත්කාර්යය සඳහා සාදන ලද රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි" යන වචන වෙනුවට "නියම කරනු ලැබිය හැකි පරිදි" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(2අ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කළ බලපත්‍රයක එම ගුවන්විදුලි සංඛ්‍යාතය හෝ ගුවන්විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ භාවිත කරන සේවාව හෝ සේවාවන් හෝ කාර්යය සහ එම බලපත්‍රයේ වලංගු කාලසීමාව, නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.";

(4) එහි (3) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කළ යම් බලපත්‍රයක්, එම බලපත්‍රය යටත් වන්නා වූ යම් කොන්දේසියක් හෝ සීමා කිරීමක් කඩ කරනු ලැබූ විට හෝ ඒ යටතේ ගෙවිය යුතු යම් ප්‍රතිෂ්ඨාවක් ගෙවීම පැහැර හරින ලද විටක හෝ එවැනි කරුණුවලට අදාළව මේ පනත යටතේ තත්කාලයේ බල පවත්නා යම් නියෝග සමඟ අනුකූලව වීමට බලපත්‍රලාභියා විසින් අපොහොසත් වන අවස්ථාවක, ඒ බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට කොමිෂන් සභාවට බලතල පැවතිය යුතු ය.";

(5) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(3අ) (1) වන උපවගන්තිය යටතේ සංඛාත බලපත්‍රයක් මගින් පවරන ලද යම් ගුවන්විදුලි සංඛ්‍යාතයක් හෝ එවැනි ගුවන්විදුලි සංඛ්‍යාතයක් පවරනු ලැබ ඇති යම් සේවාවක් හෝ සේවාවන් හෝ කාර්යය කොමිෂන් සභාව විසින්, කලින් කල, වෙනස් කිරීම හෝ ඉවත් කර ගැනීම කරනු ලැබිය හැකි ය.

(3ආ) යම් ගුවන්විදුලි සංඛ්‍යාතයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට, වෙනස් කිරීමට හෝ ඉවත් කර ගැනීමට පෙරාතුව වූ සාධාරණ කාලසීමාවක දී අදාළ තැනැත්තාට ලිඛිත දැන්වීමක් ලබා දීමෙන් පසුව කොමිෂන් සභාව විසින් ඒ සඳහා හේතු දක්වමින් එම ගුවන්විදුලි සංඛ්‍යාතයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම, වෙනස් කිරීම හෝ ඉවත් කර ගැනීම කරනු ලැබිය හැකි ය.

(3ඇ) (3ආ) වන උපවගන්තිය යටතේ සංඛ්‍යාත බලපත්‍රය වෙනස් කරනු ලැබ හෝ ඉවත් කර ගනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුගේ ද, එම අදාළ තැනැත්තාට යම් වන්දියක් ගෙවීමට කොමිෂන් සභාව විසින් සලකා බලනු ලැබිය හැකි ය.

(3ඈ) සමස්ත ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සැලසුම් කිරීමේ දී සහ කළමනාකරණයේ දී, මහජන යහපත පිණිස ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කාර්යක්ෂමව භාවිත කිරීම සඳහා නව තාක්ෂණය සමග අනුකූල වන ලෙස හා නව තාක්ෂණය යොදාගන්නා ලෙස (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති තැනැත්තකු වෙත විධාන කිරීම සඳහා කොමිෂන් සභාවට බලතල තිබිය යුතු ය.";

(6) එහි (5) වන උපවගන්තියේ "පාවිච්චි කරන තැනැත්තෙක්" යන වචන වෙනුවට "(6) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි හැර, පාවිච්චි කරන තැනැත්තෙක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(7) එහි (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(6) මේ වගන්තියේ පෙර විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මහජන යහපත පිණිස, සහ යම් ගුවන්විදුලි සංඛ්‍යාත පොදුවේ භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා කොමිෂන් සභාව විසින්

තත්කාර්යය සඳහා සාදනු ලබන රීති මගින් යම් තැනැත්තකු හෝ යම් තැනැත්තන් පන්තියක් යම් ගුවන්විදුලි සංඛ්‍යාත විමෝචන භාවිත කිරීම සඳහා සන්තකයේ තබා ගැනීම, පිහිටුවීම හෝ සවිකිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට සිදු වීමෙන් සම්පූර්ණයෙන් ම හෝ නැතහොත් රීති යටතේ පනවනු ලැබිය හැකි පරිදි යම් නියම, කොන්දේසි සහ සීමා කිරීම්වලට යටත්ව නිදහස් කරනු ලැබිය හැකි ය.

(7) කොමිෂන් සභාව විසින් ගුවන් විදුලි සංඛ්‍යාතයක් පැවරීමේ දී තරඟකාරිත්වය පදනම් වූ ක්‍රමවේදයක් පිළිගනු ලැබිය හැකි අතර අවශ්‍ය වන අවස්ථාවල දී, එවැනි ක්‍රමවේදයක් මේ පනත යටතේ සාදන ලද රීති මගින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබිය යුතු ය.".

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තියේ "යම් ස්ථානයක කේබල් ඇදීමේ වැඩ කිරීම," යන වචන වෙනුවට, "භූමිය, මහාමාර්ග හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය මතින් හෝ යටින් යම් ස්ථානයක කේබල් ඇදීමේ වැඩ කිරීම" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (3) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(3) කොමිෂන් සභාව විසින්, ඕනෑම අවස්ථාවක, මේ වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද යම් බලපත්‍රයක්-

(අ) බලපත්‍රලාභියා විසින් බලපත්‍රයේ යම් නියමයක් හෝ කොන්දේසියක් කඩකිරීම මත;

(ආ) (2) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් නිශ්චය කරන ලද ගාස්තු ගෙවීමට බලපත්‍රලාභියා විසින් අපොහොසත් වීම මත;

(ඈ) පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ රීතියක විධිවිධාන සමඟ අනුකූල වීමට බලපත්‍රලාභියා විසින් අපොහොසත් වීම මත; හෝ

(ඇ) එම ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අත්හිටුවීම මහජන යහපත පිණිස හෝ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක දී,

ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අත්හිටුවීම කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 22අඅ, 22අආ, 22අඇ සහ 22අඈ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 22අඅ 22අආ, 22අඇ සහ 22අඈ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු යː-

ආරක්ෂා කිරීම කොමිෂන් සභාවේ වගකීමක් විය යුතු බව

22අඅ. (1) කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා පොලීසියේ සහාය ඇතිව, මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික සමුද්‍රාන්ත කේබල් ආරක්ෂා කිරීමේ කමිටුවේ උපදෙස්වලට යටත්ව, මේ පනත යටතේ යම් විදුලි සංදේශ සේවාවක් සැපයීමට සම්බන්ධිත ශ්‍රී ලංකා දේශීය ජල තීරය තුළ අතුරා ඇති සමුද්‍රාන්ත කේබල් අධීක්ෂණය කිරීම, කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම කළ යුතු ය.

(2) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත (මේ වගන්තියේ සහ 22අආ වන වගන්තියේ "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික සමුද්‍රාන්ත කේබල් ආරක්ෂා කිරීමේ කමිටුව ලෙස සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු යː-

(අ) කමිටුවේ සභාපතිවරයා විය යුතු කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ආ) නාවික හමුදාවේ අණදෙන නිලධරයා විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධරයකු;

(ඇ) වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වෙරළ ආරක්ෂක නිලධරයකු;

(ඈ) පොලිස්පතිවරයා විසින් නම් කරනු ලබන පොලිස් හමුදාවේ පොලිස් නිලධරයකු;

(ඉ) (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කළ රේගු නිලධරයකු;

(ඊ) ධීවර සහ ජලජ සම්පත් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයාගේ ධුරයට අඩු නොවන ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන නිලධරයකු;

(උ) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත මගින් පිහිටුවන ලද සමුද්‍ර පරිසර අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා විසින් නම් කරනු ලබන ඒ අධිකාරියේ නිලධරයකු;

(ඌ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත මගින් පිහිටුවන ලද මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන ඒ අධිකාරියේ නිලධරයකු;

(එ) කේබල් ගොඩබිමට සම්බන්ධ කරන ස්ථානයක් ක්‍රියාත්මක කිරීමට 17ආ වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය යටතේ නිකුත් කළ බලපත්‍රයක් සහිත සැපයුම්කරුවන්; සහ

(ඒ) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 3 වන වගන්තිය යටතේ පත් කළ වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන නිලධරයකු.

(3) කමිටුවට පහත දැක්වෙන බලතල සහ කර්තව්‍යයන් පැවතිය යුතු ය:-

(අ) මේ පනත යටතේ යම් විදුලි සංදේශ සේවාවක් සැපයීමට සම්බන්ධිත ශ්‍රී ලංකා දේශීය ජල තීරයේ අතුරා ඇති සමුද්‍රාන්ත කේබල් අධීක්ෂණය කිරීමේ දී, කළමනාකරණය කිරීමේ දී සහ ආරක්ෂා කිරීමේ දී කොමිෂන් සභාවට උපදෙස් ලබා දීම;

(ආ) සමුද්‍රාන්ත කේබල් සහ සමුද්‍රාන්ත කේබල් ගොඩබිමට සම්බන්ධ කරන ස්ථාන ආරක්ෂා කිරීම සහ ප්‍රකෘති තත්ත්වයට පත් කිරීමට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම; සහ

(ඇ) නියම කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් බලතල හෝ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම.

ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතු ආරක්ෂිත කලාප

22අආ. (1) අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ නිර්දේශ අනුව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන ප්‍රකාශනයක් මගින් ජනාධිපතිවරයා විසින් සමුද්‍රාන්ත කේබල් සහ සමුද්‍රාන්ත කේබල් ගොඩබිමට සම්බන්ධ කරන ස්ථානයකට අදාළ ආරක්ෂිත කලාපයක් විය යුතු (මෙහි මින් මතු "ආරක්ෂිත කලාපය" යනුවෙන් සඳහන් කරනු ලබන) ස්ව සම්පත් කලාප ඇතුළත්ව දේශීය ජල තීරයට යාබද සාගරයේ යම් කලාපයක් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ නිර්දේශය ඉදිරිපත් කිරීමට පෙරාතුව ම එම කාරණාව සම්බන්ධයෙන් කමිටුවේ නිර්දේශ ලබා ගත යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ආරක්ෂිත කලාපයක් ලෙස යම් කලාපයක් ප්‍රකාශයට පත් කරන ලෙසට යම් ක්‍රියාකරුවකු විසින් අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටින අවස්ථාවක, අමාත්‍යවරයා විසින් කමිටුවේ නිර්දේශ ලබා ගත යුතු අතර, ඔහුගේ නිර්දේශ ජනාධිපතිවරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(4) ජනාධිපතිවරයා විසින් එම කලාපය ආරක්ෂිත කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක, අමාත්‍යවරයා විසින් එම තීරණය අදාළ ක්‍රියාකරුට දැනුම් දීමට කටයුතු සැලැස්විය යුතු ය.

(5) ජනාධිපතිවරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් වන්නේ යම් ක්‍රියාකරුවකු ද, එම ක්‍රියාකරුවා විසින් ඒ තීරණය ලබා දුන් දින සිට දින හතලිස්පහක් ඇතුළත අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(6) අමාත්‍යවරයා විසින්, කමිටුව විමසා, අභියාචනය පිළිබඳ ඔහුගේ නිර්දේශ ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම අභියාචනය ලැබුණු දින සිට දින හතලිස්පහක් ඇතුළත ජනාධිපතිවරයා විසින් එම අභියාචනය පිළිබඳ තීරණය ගනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ සිදු කරන ලද ජනාධිපතිවරායාගේ තීරණය අවසාන සහ තීරණාත්මක විය යුතු ය.

(7) (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද ප්‍රකාශනය ජනාධිපතිවරයා විසින් කැමති ආකාරයෙන් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ වෙනස් කිරීම සිදු කළ හැකි ය.

ආරක්ෂිත කලාපය තුළ ඇතැම් ක්‍රියාකාරකම් තහනම් කිරීම

22අඇ. (1) කොමිෂන් සභාව විසින්, කමිටුව විමසා, යම් ආරක්ෂිත කලාපයක් ඇතුළත, මතුපිට හෝ යටින් සිදු කරගෙන යෑමට තහනම් ක්‍රියාකාරකම් නිශ්චිතව දැක්වීමට රීති සාදනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව පහත දැක්වෙන කරුණු සඳහා කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය යුතු ය:-

(අ) පහත දැක්වෙන ධීවර ක්‍රම සහ උපකරණ භාවිතය තහනම් කිරීම:-

(i) සාගර පත්ල මත හෝ ආසන්නයේ වැඩ කිරීමට නිර්මාණය කළ මාළු අල්ලන උපකරණ;

(ii) සාගර පත්ලට නැංගුරම් දමා ඇති සහ ඉපිලෙමින් සිරස්ව පිහිටන ලෙස සවි කළ දැලක්;

(iii) සාගර පත්ලේ හෝ ඒ ආසන්නයේ මසුන් ඇල්ලීමට සැලසුම් කරන ලද යොතක්;

(iv) ඩ්‍රෙජරය සවි කළ බෝට්ටුවක්;

(v) කෝවක් හෝ උගුලක්;

(vi) මාදැලක්;

(vii) මසුන් අල්ලා ගැනීමට ආකර්ශනය කර ගැනීමේ ප්‍රාථමික ක්‍රියාකාරිත්වයෙන් යුතු සාගර පත්ලේ නැංගුරම් දා ඇති ව්‍යුහයක්;

(ආ) නැවකින්-

(i) (අ) වන ඡේදයේ සඳහන් කරන ලද යම් අයිතමයක්; හෝ

(ii) දැලක්, කඹයක්, දම්වැලක් හෝ ධීවර මෙහෙයුම් සම්බන්ධයෙන් භාවිත කරන වෙනත් යම් ද්‍රව්‍යයක්,

ඇදගෙන යාම, ක්‍රියාකරවීම හෝ එල්ලා තැබීම තහනම් කිරීම;

(ඇ) නැවකින් නැංගුරමක් පහත හෙළීම, එසවීම හෝ එල්ලා තැබීම තහනම් කිරීම;

(ඈ) වැලි ගොඩදැමීම තහනම් කිරීම;

(ඉ) (සමුද්‍රීය ජීවීන් හැර) සම්පත් උපයෝගී කර ගැනීම සඳහා හෝ ප්‍රයෝජනයට ගැනීම සඳහා ගවේෂණය කිරීම තහනම් කිරීම;

(ඊ) කැණීම් සහ කැණීමේ ශිල්පීය ක්‍රම භාවිත කිරීම තහනම් කිරීම;

(උ) එම වස්තුවක් සාගර පත්ල හා ගැටීමේ දී සමුද්‍රාන්ත කේබලය හානි විය හැකි ආකාරයෙන් එම වස්තුව සහ සමුද්‍රාන්ත කේබලය අතර සම්බන්ධයක් වේ නම්, එවැනි බරපතළ අවදානමකට සම්බන්ධ වන්නා වූ යම් කාර්යයක් තහනම් කිරීම; හෝ

(ඌ) සමුද්‍රාන්ත කේබලයකට හානි වීමේ බරපතළ අවදානමකට සම්බන්ධ විය හැකි යම් ක්‍රියාවක් සමුද්‍රාන්ත කේබලයක් අසල සිදු කරන්නේ නම් එවැනි ක්‍රියාවක් තහනම් කිරීම.

වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීම

22අඈ. (1) 22අඇ වන වගන්තිය යටතේ වරදක් සිදු කරන හෝ ඒ යටතේ සාදන ලද යම් රීතියක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු දේශීය ජල තීරය හෝ ආරක්ෂිත කලාපයක් ඇතුළත්ව ශ්‍රී ලංකාව තුළ දී යම් බලයලත් යම් නිලධරයකු විසින් වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගෙන නිසි අධිකරණ බලය ඇති මහාධිකරණයක් වෙත එම තැනැත්තා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තැනැත්තකු අත්අඩංගුවට ගනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා අත්අඩංගුවට ගනු ලැබ ඇත්තේ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් ද එම වරද සිදු කිරීමේ දී භාවිත කරනු ලැබ ඇති ද්‍රව්‍යයක්, නිසි අධිකරණ බලය සහිත මහාධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි තහනමකට ගෙන යම් ස්ථානයක රඳවා තබනු ලැබිය හැකි ය.

(3) තත්කාර්ය සඳහා ලියවිල්ලකින් නම් කරනු ලබන පහත දැක්වෙන නිලධරයන් මේ වගන්තියේ කාර්ය සඳහා බලයලත් නිලධරයකු විය යුතු ය:-

(අ) පොලිස් හමුදාවේ සාජන්ට්වරයකුගේ ධුරයට අඩු නොවන පොලිස් නිලධරයකු;

(ආ) සෙබළකුගේ ධුරයට අඩු නොවන යුධ හමුදාවේ සාමාජිකයකු;

(ඇ) සුළු නිලධරයකුගේ ධුරයට අඩු නොවන ශ්‍රී ලංකා නාවික හමුදාවේ සාමාජිකයකු;

(ඈ) සාජන්ට්වරයකුගේ ධුරයට අඩු නොවන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු; හෝ

(ඉ) වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධරයකු.

(4) සෑම බලයලත් නිලධරයකු ම, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා සාම නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.".

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඊ වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඊ වන වගන්ති සංශෝධනය

(1) එහි (ඇ) වන ඡේදයේ "ලැබෙන මුදල්; සහ" යන වචන වෙනුවට "ලැබෙන මුදල්;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (ඇ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඇඇ) 11 වන වගන්තියේ (8) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් පනවන ලද දණ්ඩනයක් ලෙස එකතු කළ එවැනි සියලු මුදල්; සහ".

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඒ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ කොටස එම ප්‍රඥප්තියේ IIඇ වන කොටස ලෙස බලාත්මක විය යුතු යː-

ප්‍රධාන ප්‍රඥප්තියට IIඇ වන අලුත් කොටස ඇතුළත් කිරීම

"IIඇ වන කොටස

**බලපත්‍ර ගාස්තුව සහ සෙස් බද්ද මත අධිභාරයක් පැනවීම**

මේ පනත යටතේ යම් බලපත්‍රයක ගාස්තුව හෝ සෙස් බද්ද ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් අධිභාරයක් පැනවිය යුතු බව

22ඔ. (1) අවස්ථාවෝචිත පරිදි, 17 වන, 17ආ වන, 21 වන හෝ 22 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් ක්‍රියාකරුවකු, සැපයුම්කරුවකු, බලපත්‍රලාභියකු විසින් එම වගන්ති ප්‍රකාරව ගෙවීමට නියම කර ඇති යම් ගාස්තුවක්, එම ගාස්තුව ගෙවීම සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇති දිනයේ දී හෝ එදිනට පෙර ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක හෝ යම් ක්‍රියාකරුවකු විසින් 22උ වන වගන්තිය යටතේ සාදන ලද නියමයක් මගින් ගෙවීමට නියම කර ඇති යම් සෙස් බද්දක්, 17 වන හෝ 17ආ වන වගන්ති යටතේ නිකුත් කර ඇති බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති දිනයේ දී හෝ එදිනට පෙර ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක, ගෙවීම පැහැර හරින ලද මුදල් ප්‍රමාණයේ, පළමු මාසය සඳහා ගෙවීම පැහැර හරින ලද මුදල මත සියයට දහයක අනුප්‍රමාණයක අධිභාරයක් ගෙවීමට එම ක්‍රියාකරු, සැපයුම්කරු හෝ බලපත්‍රලාභියා යටත් විය යුතු අතර, ඉන් පසුව එළඹෙන එක් එක් අනුගාමී මාසය සඳහා ගෙවීම පැහැර හරින ලද මුදල මත සියයට දෙකක අතිරේක අධිභාරයක් ගෙවීමට ද යටත් විය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් අධිභාරය පනවනු ලබන්නේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද, එම එක් එක් තැනැත්තා වෙත පහත දැක්වෙන විස්තර නිශ්චිතව දක්වමින් දැන්වීමක් නිකුත් කරනු ලැබිය යුතු යː-

(අ) අධිභාරය පැනවීම සඳහා වන හේතු;

(ආ) පැහැර හරින ලද මුදල සහ ඒ මත පැනවීමට තීරණය කර ඇති අධිභාරය;

(ඇ) එය අය කර ගැනීම සඳහා අනුගමනය කිරීමට අරමුණු කරන ක්‍රියාමාර්ගය;

(ඈ) (ආ) වන ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති මුදල ගෙවිය යුතු දිනය; සහ

(ඉ) ගෙවීම සිදු කළ යුතු ආකාරය සම්බන්ධ තොරතුරු.

අය කර ගැනීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු පැවරීම

22ඕ. (1) 22ඔ වන වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු යම් මුදලක් 22ඔ වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වන දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත නොගෙවනු ලැබ ඇති අවස්ථාවක සහ එකී මුදල අය කර ගැනීම සඳහා වහාම ක්‍රියාමාර්ගයක් ගැනීම අවශ්‍ය බවට කොමිෂන් සභාව විසින් සෑහීමට පත් වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එසේ අය කර ගනු ලැබිය යුතු මුදල පිළිබඳ විස්තර සහ එම මුදල ගෙවීමට යටත්ව සිටින තැනැත්තාගේ නම සහ අවසන්වරට දැන සිටි ඔහුගේ සේවා නියුක්තියේ ස්ථානය හෝ ඔහු පදිංචිව සිටි ස්ථාන පිළිබඳ තොරතුරු අන්තර්ගත වන සහතිකයක්, නිසි අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත් අධිකරණය වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (අ) එවිට, මහෙස්ත්‍රාත්වරයා විසින් ගෙවීම පැහැර හරින ලද මුදල ගෙවීමට යටත් තැනැත්තාට එරෙහිව එම අය කර ගත යුතු මුදල අය කර ගැනීම සඳහා වැඩිදුර නඩු කටයුතු නොපැවැත්විය යුත්තේ මන්ද යන්නට කරුණු දැක්වීම සඳහා ඔහු වෙත සිතාසි නිකුත් කළ යුතු ය.

(ආ) ගෙවීම පැහැර හරින ලද මුදල ගෙවීමට යටත්ව සිටින තැනැත්තා ප්‍රමාණවත් හේතු දැක්වීමට

අපොහොසත් වන අවස්ථාවක, අය කර ගත යුතු මුදල දඩ මුදලක් පැනවීමෙන් පමණක් දඬුවම් නියම කළ යුතු සහ බන්ධනාගාරගත කිරීම මගින් දඬුවම් නියම නොකළ යුතු වරදක් සඳහා, එසේ ගෙවීම පැහැර හරින ලද මුදල ගෙවීමට යටත්ව සිටින තැනැත්තා මත ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලබන දණ්ඩන නියමයකින් පනවන ලද දඩයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන සහතිකය, අය කර ගනු ලැබිය යුතු මුදල නිසි පරිදි තක්සේරු කරනු ලැබ ඇති බවට සහ (1) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ පවරන ලද යම් නඩු කටයුත්තක දී ගෙවීම පැහැර හැර ඇති බවට අවසානාත්මක ඔප්පු කිරීම විය යුතු ය.

(4) දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස්කම් සහිතව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයා විසින්, එකී දණ්ඩනය පනවන අවස්ථාවේ දී, ඔහු විසින් කරනු ලැබිය හැකි වූ යම් විධානයක් ද ඊට අමතරව කළ හැකි ය.".

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන, 34 වන සහ 35 වන වගන්තිවල "ක්‍රියාකරු" යන වචනය යෙදෙන ඕනෑම ස්ථානයක එම වචනය වෙනුවට "ක්‍රියාකරු හෝ සැපයුම්කරු" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්ති මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන, 34 වන සහ 35 වන වගන්ති සංශෝධනය කිරීම

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති එම ප්‍රඥප්තියේ 35අ වන සහ 35ආ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු යː-

ප්‍රධාන ප්‍රඥප්තියට 35අ වන සහ 35ආ වන අලුත් වගන්ති එකතු කිරීම

"යටිතල පහසුකම් හෝ සම්පත් බෙදා ගැනීම

35අ. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ යම් ක්‍රියාකරුවකු විසින් ක්‍රියාකරවීමට බලපත්‍රයක් ලබා ඇති විදුලි සංදේශ ක්‍රමයක් මාර්ගයෙන් විදුලි සංදේශ සේවා සැපයීමේ කාර්ය සඳහා හෝ එකී සැපයුම්කරු විසින් සැපයීමට බලපත්‍රයක් ලබා ඇති වෙනත් සේවාවක් හෝ පහසුකමක් හෝ සම්පතක් සැපයීමේ කාර්ය සඳහා, මේ පනත යටතේ සාදන ලද රීති මගින් නිශ්චිතව දක්වනු ලබන යම් පළාත් පාලන ආයතනයක්, රාජ්‍ය සංස්ථාවක් හෝ වෙනත් මණ්ඩලයක් විසින් හිමිකාරිත්වය දරන හෝ එවැන්නක් සතු යම් යටිතල පහසුකම් හෝ සම්පත් එකී ක්‍රියාකරුවකු හෝ සැපයුම්කරුවකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, හවුලේ බෙදා ගැනීම සඳහා, එම ක්‍රියාකරුට හෝ සැපයුම්කරුට සහාය දැක්වීම එම පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයාගේ හෝ සභාපතිවරයාගේ හෝ රාජ්‍ය සංස්ථාවේ හෝ වෙනත් ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලනාධිකාරයේ කාර්ය වන්නේ ය.

(2) මේ වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම සඳහා මේ පනත යටතේ රීති සාදනු ලැබිය යුතු ය.

ක්‍රියාකරුවන් විසින් පහසුකම් හෝ සම්පත් හවුලේ බෙදා ගැනීම

35ආ. (1) කොමිෂන් සභාව විසින්, මහජන යහපත පිණිස යම් ක්‍රියාකරුවකු විසින් හිමිකාරිත්වය දරන හෝ භාවිත කරනු ලබන ගුවන්විදුලි ප්‍රවේශ ජාලයක් ඇතුළත්ව යම් පහසුකමක හෝ සම්පතක භාවිතය හවුලේ බෙදා ගැනීම සඳහා වෙනත් ක්‍රියාකරුවකු සමඟ සම්බන්ධීකරණය වන ලෙසට සහ සහයෝගය දක්වන ලෙසට එම ක්‍රියාකරු වෙත ලිඛිතව විධාන කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විධාන නිකුත් කිරීමට පෙරාතුව, කොමිෂන් සභාව විසින්, එම පහසුකම හෝ සම්පත කාර්යක්ෂම ආකාරයකින් හවුලේ බෙදා ගැනීමට පහසුකම් සැලැස්වීම පිණිස, කරුණු ඉදිරිපත් කිරීම සඳහා එම ක්‍රියාකරුවන්

දෙදෙනාට ම සාධාරණ අවස්ථාවක් ලබා දෙනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම විධිමත් කිරීමට රීති සාදනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන සහ 37 වන වගන්ති සංශෝධනය කිරීම

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන සහ 37 වන වගන්තිවල “ක්‍රියාකරු” යන වචනය යෙදෙන ඕනෑම ස්ථානයක එම වචනය වෙනුවට “ක්‍රියාකරු හෝ සැපයුම්කරු” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්ති මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) “ක්‍රියාකරු” යන වචනය වෙනුවට “ක්‍රියාකරු හෝ සැපයුම්කරු” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ “37 වන වගන්තිය” යන වචන සහ ඉලක්කම වෙනුවට “35අ වන වගන්තිය හෝ 36 වන වගන්තිය” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන සහ 40 වන වගන්ති සංශෝධනය කිරීම

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන සහ 40 වන වගන්තිවල “ක්‍රියාකරු” යන වචනය යෙදෙන ඕනෑම ස්ථානයක, එම වචනය වෙනුවට “ක්‍රියාකරු හෝ සැපයුම්කරු” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්ති මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ (2) වන උපවගන්තියේ “(1) වන උපවගන්තිය යටතේ” යන වචන සහ ඉලක්කම වෙනුවට “මේ පනතේ 22අඇ වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති වරදවල් හැර, (1) වන උපවගන්තිය යටතේ” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) 19 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 22 වන වගන්තිය යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම මහෙස්ත්‍රාත්වරයා විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස්දහසකට නොඅඩු සහ රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොඅඩු සහ අවුරුදු තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම ද, වරද අඛණ්ඩව සිදු කරගෙන යනු ලබන අවස්ථාවක, වරදකරු කිරීමෙන් පසුව එසේ වරද සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් දෙදහසක් බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය.";

(2) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) (1) වන උපවගන්තිය යටතේ පනවන ලද දණ්ඩනයට අමතරව, 19 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීමේ දී භාවිත කරන ලද සියලු විදුලි සංදේශ උපකරණ රාජසන්තක කරන ලෙසට මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(1ආ) 17ආ වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වන වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම, මහෙස්ත්‍රාත්වරයා විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන පහකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම ද යටත් විය යුතු අතර, වරද අඛණ්ඩව සිදු කරගෙන යනු ලබන අවස්ථාවක, වරදකරු කිරීමෙන් පසුව එසේ වරද සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් දසදහසක් බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය.".

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති එම ප්‍රඥප්තියේ 46අ වන, 46ආ වන සහ 46ඇ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු යः-

ප්‍රධාන ප්‍රඥප්තියට 46අ වන, 46ආ වන සහ 46ඇ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම

"විදුලි සංදේශ ක්‍රමයකට බාධා කිරීම ආදිය

46අ. 17 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් විදුලි සංදේශ ක්‍රමයකට හෝ 22 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් ගුවන්විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයකට සිතාමතාම බාධා කරන, කඩා බිඳ දමන හෝ අවහිර කර සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයා විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන පහකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය

.විදුලි සංදේශ ක්‍රමයක් භාවිත කරන තැනැත්තන් රැවටීම හෝ නොමඟ යැවීම

46ආ. වෙනත් යම් තැනැත්තකු දුර්නියෝජනය කිරීමේ, රැවටීමේ හෝ නොමඟ යැවීමේ අදහස ඇතිව අමතන පාර්ශ්වයේ අංකය සඳහන් නොකර සිටින, වෙනස් කරන හෝ මඳ වශයෙන් වෙනස් කරන හෝ ස්වකීය අංකය නොවන වෙනත් යම් අමතන පාර්ශ්වයක අංකයක් ඉදිරිපත් කරන සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට සහ අවුරුද්දකට නොඅඩු සහ අවුරුදු තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

විදුලි සංදේශ සේවා ලබා ගැනීම සඳහා පරිශීලක අනන්‍යතාව සඳහා අසත්‍ය තොරතුරු සැපයීම

46ඇ. විදුලි සංදේශ සේවාවක් ලබා ගැනීම සඳහා පරිශීලකයකුගේ අනන්‍යතාවය සඳහා සිතාමතාම අසත්‍ය තොරතුරු සපයන සෑම තැනැත්තකු ම වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් මිලියනයකට නොවැඩි සහ අවුරුද්දකට නොඅඩු සහ අවුරුදු තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය ඉවත් කර, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"විදුලි සංදේශ ස්ථාපනයකට චේතනාන්විතව අලාභ කිරීම හෝ එය අනිසි ලෙස අතපත ගෑම සම්බන්ධ දණ්ඩනය

47. (අ) යම් පණිවුඩයක්, විදුලි සංදේශ සේවාවක් හෝ දත්ත සම්ප්‍රේෂණය කිරීම හෝ භාර දීම වැළැක්වීමේ හෝ ඊට බාධා කිරීමේ චේතනාවෙන්; හෝ

(ආ) යම් පණිවුඩයකට හෝ දත්තවලට අතරමඟක දී බාධා කිරීමේ හෝ එහි ඇතුළත් කරුණු දැන ගැනීමේ චේතනාවෙන්; හෝ

(ඇ) යම් පණිවුඩයක් සම්ප්‍රේෂණය කිරීමේ බලය තමන් වෙත නැතිව එය සම්ප්‍රේෂණය කිරීමේ චේතනාවෙන්; හෝ

(ඈ) අනර්ථයක් කිරීමේ හෝ වනසා දැමීමේ ක්‍රියාවක් කිරීමේ චේතනාවෙන්,

යම් සමුද්‍රාන්ත කේබලයකට, සමුද්‍රාන්ත කේබල් ගොඩබෑමේ ස්ථානයකට හෝ යම් විදුලි සංදේශ ස්ථාපන සබැඳියකට, කාණුවකට හෝ යම් විදුලි සංදේශ සේවා ක්‍රමයක හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ස්ව සම්පත් කලාපයෙන් බැහැර යම් සේවාවක් සපයන යම් සමුද්‍රාන්ත කේබලයක කොටසක් වන හෝ එය ක්‍රියාකරවීමෙහි ලා භාවිත කරනු ලබන වෙනත් කවර වූ හෝ දෙයකට අලාභ කරන, එය ඉවත් කරන හෝ අනිසි ලෙස අතපතගාන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන සියයකට නොවැඩි දඩයකට හෝ වසර දහයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කිරීම

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) යම් විදුලි සංදේශ නිලධරයකුට හෝ යම් තැනැත්තකුට පීඩාවක්, හිරිහැරයක් හෝ අනවශ්‍ය අවුල් සහගත බවක් ඇති කිරීමේ අරමුණ ඇතිව සාධාරණ හේතුවක් නොමැතිව,

(අ) දුරකථනයක් භාවිතයෙන් නිරන්තරයෙන් දුරකථන ඇමතුම් ලබා ගන්නා හෝ පණිවුඩ යවන හෝ සම්ප්‍රේෂණය කරන; හෝ

(ආ) වෙනත් ග්‍රාහකයන්ගේ දුරකථන අංක ප්‍රසිද්ධ කරන, යවන හෝ සම්ප්‍රේෂණය කරන,

සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට සහ එකී දඩය ගෙවීම පැහැර හැරීමේ දී, මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ යටත් විය යුතු ය."; සහ

(2) එහි (2) වන උපවගන්තියේ "එවැනි ඇමතුමක් කිරීමට ඉඩදීම ප්‍රතික්ෂේප කිරීම හෝ" යන වචන වෙනුවට "එවැනි ඇමතුමක් කිරීමට ඉඩදීම ප්‍රතික්ෂේප කිරීම හෝ එකී ඇමතුම සිදු කරන ලද්දේ කුමන දුරකථන සම්බන්ධතාවක් හරහා ද එම දුරකථන සම්බන්ධතාව විසන්ධි කිරීමට කටයුතු කිරීම හෝ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 59අ වන සහ 59ආ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති මේ ප්‍රඥප්තියේ 59අ වන සහ 59ආ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු යː-

"දුරකථනයක් භාවිතයෙන් මහජන කැළඹීම ඇති කිරීම හෝ මහජන සාමය කඩ කිරීම සඳහා වන දණ්ඩනය

59අ. මහජන කැළඹීම ඇති කිරීමේ හෝ මහජන සාමය කඩකිරීමේ අදහස ඇතිව දුරකථනයක් භාවිතයෙන් සිතාමතාම දුරකථන ඇමතුමක් ලබා ගන්නා හෝ පණිවුඩ යවන හෝ සම්ප්‍රේෂණය කරන සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි

කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම ද, වරද අඛණ්ඩව සිදු කරගෙන යනු ලබන අවස්ථාවක, එසේ වරද සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් එක් දහස් පන්සියය බැගින් වූ දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම ද යටත් විය යුතු ය.

අසත්‍ය ප්‍රකාශ, තොරතුරු ආදිය

59ආ. දැනුම්වත්ව ම-

(අ) මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීමට අදාළව යම් අසත්‍ය හෝ නොමඟ යවන සුළු තොරතුරක් ලබා දෙන හෝ ලබා දීමට කටයුතු කරන; හෝ

(ආ) කොමිෂන් සභාව වෙත හෝ කොමිෂන් සභාවට සහාය දැක්වීම සඳහා පත් කරන ලද වෙනත් යම් නිලධරයකු වෙත අසත්‍ය හෝ නොමඟ යවන සුළු තොරතුරක් ලබා දෙන හෝ ලබා දීමට කටයුතු කරන,

යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමේ දී රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ එකී දඩය ගෙවීම පැහැර හරින අවස්ථාවක, මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන්:-

"(3) යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු කරනු ලබන අවස්ථාවක, එම වරද සිදු කිරීමේ දී භාවිත කළ හෝ එම වරද සිදු කිරීමට සම්බන්ධ යම් විදුලි සංදේශ උපකරණයක් රාජ්‍යයට රාජසන්තක කරන ලෙසට මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(4) මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාවකින් රාජසන්තක කරන ලද යම් විදුලි සංදේශ උපකරණයක් එකී ආඥාව කිරීමෙන් පසුව පරම වශයෙන් ම රාජ්‍යය වෙත පැවරෙන්නේ ය.

(5) එකී පැවරීම -

(අ) රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණය වෙත හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසුව කිසිදු අභියාචනයක් ඉදිරිපත් වී නොමැති නම්; හෝ

(ආ) රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක් වෙත හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, රාජසන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින් හෝ අභියාචනය බැහැර කරමින්, එකී අභියාචනය තීරණය කිරීමෙන් පසුව,

බලාත්මක විය යුතු ය.''; සහ

(2) එම වගන්තියේ පැති සටහන ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"මහෙස්ත්‍රාත්වරයා විසින් සෝදිසි වරෙන්තුවක් නිකුත් කිරීම සහ විදුලි සංදේශ උපකරණ තහනමට ගැනීම සහ රාජසන්තක කිරීම".

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම

"(1අ) (1) වන උපවගන්තිය යටතේ පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් රීති සෑදීමට කොමිෂන් සභාවට බලතල තිබිය යුතු ය:-

(අ) අදාළ ක්‍රියාකරුවන්ට, සැපයුම්කරුවන්ට සහ බලපත්‍රලාභීන්ට අදාළ විය යුතු චර්යා සංග්‍රහ සකස් කිරීම සඳහා;

(ආ) ක්‍රියාකරුවන්, සැපයුම්කරුවන් සහ බලපත්‍රලාභීන් විසින් අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු මාර්ගෝපදේශ, කලින් කල, නිකුත් කිරීම සඳහා; සහ

(ඇ) ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමනාකරණය කිරීම සඳහා.".

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) "කේබල් ඇදීමේ වැඩ" යන යෙදුමේ අර්ථ නිරූපණයට පෙරාතුව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

""යුද හමුදාව" යන්නෙන්, (357 වන අධිකාරය වූ) යුද හමුදා පනත යටතේ පිහිටුවා පවත්වාගෙන යනු ලබන යුද හමුදාව අදහස් වේ;

"කේබල් ගොඩබිමට සම්බන්ධ කරන ස්ථානය" යන්නෙන්, දේශීය ජාලයට සම්බන්ධිත ජාත්‍යන්තර විදුලි සංදේශ සහ අන්තර්ජාල ප්‍රවාහය රැගෙන යන සමුද්‍රීය ප්‍රකාශ තන්තු කේබල් පහසුකමක් අදහස් වේ;";

(2) "කේබල් ඇදීමේ වැඩ" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

""වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව" යන්නෙන්, 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව අදහස් වේ;";

(3) "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

""ස්ව සම්පත් කලාපය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 5 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද කලාපයක් අදහස් වේ;

"යටිතල පහසුකම" යන්නෙන්, විදුලි සංදේශ සේවා සැපයීමේ කාර්ය සඳහා භාවිත කරන සබැඳියක්, සමුද්‍රාන්ත කේබල්, බෙදා හැරීමේ ලක්ෂ්‍යයක්, ප්‍රනාල පද්ධතියක්, කුහරයක්, උමගක්, කාණු කවාට, කුලුනක්, තුඹසක්, දණ්ඩක්, ඇන්ටනාවක්, ව්‍යුහයක් සහ සක්‍රීය ජාලයක් අදහස් වේ;";

(4) "ක්‍රියාකරු" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

""තැනැත්තා" යන්නට, පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

"පොලිස් නිලධරයා" යන්නෙන්, (53 වන අධිකාරය වූ) පොලිස් ආඥාපනත මඟින් පවරා ඇති අර්ථය ම විය යුතු ය;";

(5) "නියමිත" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

""සැපයුම්කරු" යන්නෙන්, විදුලි සංදේශ සේවා හෝ යටිතල පහසුකම් හෝ කේබල් ගොඩබිමට සම්බන්ධ කරන ස්ථාන පහසුකම් සැපයීමට 17ආ වන වගන්තිය යටතේ බලපත්‍රයක් මඟින් බලය පැවරී ඇති තැනැත්තකු අදහස් වේ;";

(6) "පොදු ස්විච්ගත පද්ධතිය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

""ගුවන්විදුලි ප්‍රවේශ ජාලය" යන්නෙන්, ගුවන්විදුලි සබැඳියක් හරහා මූලික ජාලයට ආන්තික පරිශීලක උපාංග සම්බන්ධ වන විදුලි සංදේශ ජාලයක කොටසක් අදහස් වේ;"; සහ

(7) "ගුවන් විදුලි ධාරාව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

""ගුවන්විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණය" යන්නෙන්, ගුවන්විදුලි තරංග සම්ප්‍රේෂණය හෝ විමෝචනය කිරීමට සැලසුම් කරන ලද හෝ අදහස් කරන ලද ගුවන්විදුලි සන්නිවේදන උපකරණයක් අදහස් වේ;

"ශ්‍රී ලංකා ගුවන් හමුදාව" යන්නෙන්, (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවා පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා ගුවන් හමුදාව අදහස් වේ;

"ශ්‍රී ලංකා නාවික හමුදාව" යන්නෙන්, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවා පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා නාවික හමුදාව අදහස් වේ;

"සමුද්‍රාන්ත කේබල්" යන්නෙන්, විදුලි සංදේශ සංඥා රැගෙන යාම සඳහා භූමිය පදනම් කර ගත් ස්ථාන අතර සාගරය යට අතුරන ලද කේබලයක් අදහස් වේ.".

**37.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව